# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2021 අංක 20 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2021 සැප්තැම්බර් මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2021 සැප්තැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 9.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2021 අංක 20 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2021 සැප්තැම්බර් මස 22 වන දින]

එල්.ඩී.—ඕ. 46/2021

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**1.** මේ පනත 2021 අංක 20 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 60 වන වගන්තිය, පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2003 අංක 9 දරන පනතේ 60 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"(4අ) 20 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයකට අනුකූල වීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ එවැනි නියමයක් උල්ලංඝනය වන පරිදි ක්‍රියාකරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට -

(අ) ඒ තැනැත්තා සංස්ථාවක් නොවන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂ එකකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඉන් පසුව සිදු කරනු ලබන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු සහ

රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම; හෝ

(ආ) ඒ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක, පළමු වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් ලක්ෂ පහකට නොඅඩු හා රුපියල් මිලියන පහකට නොවැඩි දඩයකට සහ ඉන් පසුව සිදු කරනු ලබන වරදක් සම්බන්ධයෙන් වන විට, රුපියල් මිලියන එකකට නොඅඩු හා රුපියල් මිලියන දහයකට නොවැඩි දඩයකට ද,

යටත් වන්නේ ය.''; සහ

(2) එකී (5) වන උපවගන්තියේ ''මේ වගන්තියේ (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''මේ වගන්තියේ (1) වන, (2) වන, (3) වන, (4) වන හෝ (4අ) වන උපවගන්තිවල සඳහන් විධිවිධාන'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව සිදුකර ඇති වැරදි සම්බන්ධයෙන් පනත අදාළ නොවිය යුතු බව

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තියේ (4අ) වන උපවගන්තිය යටතේ කරන ලද යම් වරදක්, එම වරද මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව කරන ලද අවස්ථාවක එම වරද සම්බන්ධයෙන් මේ පනතේ 2 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවන බව සැක දුරුකිරීමේ කාර්යය සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.